

# ආර්යවංශ සූත්‍රය

පුරාණ සන්නයසහිත

# ආර්යවංශ සූත්‍රය.


මිරිස්සෙ අභිනවාරාමවාසී

**මිරිස්සෙ ඤාණරතනතිස්ස**

ස්වාමින් වහන්සේ විසින් ශුද්ධකරණ ලදී.



මිරිස්සේ පදිංචි

ඩී. සී. ඩී. ඇස්. ජයසූරිය කොන්දෙස්තර

විසින්

කොලඹ වෙල්ලේ වීථියේ නොම්මර 36 දරණ

ස්ථානයේ සුදර්ශන යන්ත්‍රාලයෙහිදී

මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරණ ලදී.

**ශ්‍රී බුද්ධ වර්ෂ 2441.**

COLOMBO—Printed by A. Cooray.

1 8 9 8.

# අරියවංස සුත්තං.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

---

එවම්මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ
පිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍රඛො භගවා භික්ඛු ආමන්තෙසි භික්ඛවො'ති,
භදන්තෙ'ති තෙභික්ඛු භගවතො පච්චස්සොසු'සුං—භගවා එතදවොච—
චත්තාරො'මෙභික්ඛවෙ අරියවංසා, අග්ගඤ්ඤා, රත්තඤ්ඤා, වංසඤ්ඤා,
පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා නසංකීයන්ති නසංකීයිස්සන්ති
අප්පතිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි—කතමෙ චත්තාරො?—
ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති, ඉතරීතරෙන චීවරෙන ඉතරීතර
චීවරසන්තුට්ඨියාච වණ්ණවාදී, නච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආප
ජ්ජති. අලද්ධාච චීවරං න පරිතස්සති, ලද්ධා චීවරං අගධිතො අමුච්ඡිතො
අනජ්ඣාපන්නො ආදීනවදස්සාවි, නිස්සරණ පඤ්ඤො පරිභුඤ්ජති. තායච
පන ඉතරීතර චීවරසන්තුට්ඨියා නෙ'වත්තා'නුක්කංසෙති. නොපරංවම්භෙති.
යොහිතත්ථදක්ඛො අනලසොසම්පජානො පතිස්සතො අයං වුච්චති භික්ඛවෙ!
භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙඨිතො—

පුනචපරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨොහොති. ඉතරීතරෙන පිණ්ඩපා
තෙන ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨියාච වණ්ණවාදී නචපිණ්ඩපාතහෙතු
අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධාච පිණ්ඩපාතං නපරිතස්සති. ලද්ධා
ච පිණ්ඩපාතං අගධිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවි නිස්ස
රණපඤ්ඤො පරිභුඤ්ජති. තායචපන ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨියානෙ
ව'ත්තා'නුක්කංසෙති. නොපරංවම්භෙති. යොහි තත්ථ දක්ඛො අනලසො
සම්පජානො පතිස්සතො අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පොරාණෙ අග්ග
ඤ්ඤෙ අරියවංසෙ ඨිතො—

පුනචපරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති. ඉතරීතරෙන සෙනාස
නෙන ඉතරීතරසෙනාසන සන්තුට්ඨියාච වණ්ණවාදී, නච සෙනාසන හෙතු
අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධාච සෙනාසනං නපරිතස්සති. ලද්ධා
ච සෙනාසනං අගධිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී'නිස්ස-
රණපඤ්ඤො පරිභුඤ්ජති. තායචපන ඉතරීතර සෙනාසන සන්තුට්ඨියා
නෙව'ත්තානු'ක්කංසෙති. නොපරංවම්භෙති. යොහිතත්ථදක්ඛො අනල
සො සම්පජානො පතිස්සතො අයං වුච්චති භික්ඛවෙ භික්ඛු පොරාණෙ
අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො—

පුනචපරං භික්ඛවෙ භික්ඛු භාවනාර'මො හොති. භාවනාරතො පහානාරාමො හොති. පහානරතො තාය ච පන භාවනාරාමතාය භාවනාරතියා පහානාරාමතාය පහානරතියා නෙවත්තානු'ක්කංසෙති. නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො අයං වුච්චති භික්ඛවෙ 1 භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අරියවංසා, අග්ගඤ්ඤා, රත්තඤ්ඤා, වංසඤ්ඤා, පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා න සංකියන්ති න සංකියිස්සන්ති අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි—ඉමෙහි ච පන භික්ඛවෙ චතූහි අරියවංසෙහි සමන්නාගතො භික්ඛු පුරත්ථිමාය චෙපි දිසාය විහරති. ස්වෙ'ව අරතිං සහති. න තං අරති සහති. පච්ඡිමාය චෙපි දිසාය විහරති ස්වෙ'ව අරතිං සහති. න තං අරති සහති උත්තරාය චෙපි දිසාය විහරති ස්වෙ,ව අරතිං සහති. න තං අරති සහති. දක්ඛිණාය චෙපි දිසාය විහරති ස්වෙ'ව අරතිං සහති න තං අරති සහති. "තං කිස්ස හෙතු?" අරති රති සහො හි භික්ඛවෙ ධීරොති.

නාරති සහති ධීරං, නාරතිධීර සංහති
ධීරො'ව අරතිං සහති, ධීරො හි අරතිං සහො—
සබ්බකම්ම වියාකිනං, පණුන්නං කො නිවාරයෙ
නෙක්ඛං ජම්බොනදස්සෙව, කො තං නින්දිතුම'රහති
දෙවාපි නං පසංසන්ති, බ්‍රහ්මුනාපි පසංසිතො'ති.

අරියවංස සුත්තං නිට්ඨිතං.

තදට්ඨකථා.

---

අට්ඨමස්ස අත්තජ්ඣාසයිකො නික්ඛෙපො—ඉමං කිර මහා අරියවංස සුත්තන්තං භගවා ජෙතවන මහා විහාරෙ ධම්මසභායං පඤ්ඤත්තවර බුද්ධාසනෙ නිසින්නො අත්තනොපි පරපුග්ගලානම්පි අජ්ඣාසයවසෙන පරිවාරෙත්වා නිසින්නානි චත්තාළීසං භික්ඛුසහස්සානි භික්ඛවො'ති ආමන්තෙත්වා චත්තාරො මෙ භික්ඛවෙ අරියවංසා'ති ආරභි. තත්ථ වංසා'ති, අරියවංසා, අරියානං වංසා අරියවංසා යථාහි ඛත්තියවංසො බ්‍රාහ්මණවංසො වෙස්සවංසො සුද්දවංසො සමණවංසො කුලවංසො රාජවංසො'ති එවං අයම්පි අට්ඨමො අරියවංසො අරියාන'න්ති අරියපවෙනි නාම හොති. සො ඛො පනායං වංසො" ඉමෙසං වංසානං මූලගන්ධාදීනං කාලානුසාරි ගන්ධාදයො විය අග්ගමක්ඛායති—කෙ පනා තෙ අරියා? යෙසං එතෙ වංසා'ති අරියා වුච්චන්ති බුද්ධා ච පච්චෙක බුද්ධා ච තථාගත සාවකා ච—එතෙසං අරියානං වංසා'ති අරියවංසා—ඉතො පුබ්බෙ සතසහස්සං කප්පාධිකානං චතුන්නං අසංඛෙය්‍යානං මත්ථකෙ තණ්හංකරො මෙධංකරො සරණංකරො දීපංකරො'ති චත්තාරො බුද්ධා උප්පන්නා—තෙ අරියා, තෙසං අරියානං වංසා'ති අරියවංසා—තෙසං බුද්ධානං පරිනිබ්බාණතො අපර භාගෙ අසංඛෙය්‍යං අතික්කමිත්වා කොණ්ඩඤ්ඤො නාම බුද්ධො උප්පන්නො—පෙ—ඉමස්මිං කප්පෙ කකුසන්ධො කොනාගමනො කස්සපො අම්හාකං භ ග

ඩා ගොතමොති චත්තාරො බුද්ධා උප්පන්නා—තෙසං අරියානං වංසා'ති අරිය වංසා අපිච, අතීතානාගත පච්චුප්පන්නානං සබ්බබුද්ධ පච්චෙක බුද්ධසාවකානං අරියානං වංසා'ති අරියවංසා තෙ බො පනෙතෙ අරියවංසා—අග්ගඤ්ඤා'ති, අග්ගාති ජානිතබ්බා; රත්තඤ්ඤා'ති, දීඝරත්තං පවත්තාති ජානිතබ්බා; වංසඤ්ඤා'ති, වංසා'ති ජානිතබ්බා—පොරාණා'ති න අධුනුප්පත්තිකා—අසංකිණ්ණා'ති අවිකිණ්ණා, අනපනීතා—අසංකිණ්ණපුබ්බා'ති අතීතබුද්ධෙහිපි නසංකිණ්ණපුබ්බා—කිනනු ඉමෙහී'ති, න අපනීතපුබ්බා—නසංකියන්ති" ති ඉදානිපින අපනීයන්ති" නසංකියිස්සන්තී'ති අනාගත බුද්ධෙහිපි න අපනියිස්සන්ති යෙ ලොකෙ විඤ්ඤූ සමණබ්‍රාහ්මණා තෙහි අප්පටිකුට්ඨා" සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි අනින්දිතා. අගරහිතා" සන්තුට්ඨො හොතීති" පච්චයසන්තොස වසෙන සන්තුට්ඨො හොති "ඉතරීතර චීවරෙනා'ති" ථූල, සුඛුම ලූඛ පණීත, ථිර, ජිණ්ණානං යෙන කෙනචි; අථවො, යථාලද්ධාදීනං ඉතරීතරෙන යෙන කෙනචි සන්තුට්ඨො හොතීති අත්ථො; චීවරස්මිං හි තයො සන්තොසා,—1, යථාලාභ සන්තොසො, 2, යථාබල සන්තොසො—3, යථාසාරුප්ප සන්තොසොති" පිණ්ඩපාතාදීසුපි එසොව නයො—තෙසංහි විත්ථාරකථා "සන්තුට්ඨස්ස භික්ඛවෙ අනුප්පන්නාචෙව කුසලධම්මා උප්පජ්ජන්තීති" ඉමස්මිං සුත්තෙ වුත්තනයෙනෙව වෙදිතබ්බා, ඉති ඉමෙ තයො සන්තොසෙ සන්ධාය සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන යථාලද්ධාදීසු යෙන කෙනචි චීවරෙන සන්තුට්ඨො හො'ති තිවුත්තං, එත්ථච 1 චීවරං ජානිතබ්බං 2 චීවරඛෙත්තං ජානිතබ්බං 3 පංසුකූලං ජානිතබ්බං 4 චීවරසන්තොසො ජානිතබ්බො, 5 චීවරපටිසංයුත්තානි ධුතඞ්ගානි ජානිතබ්බානි—චීවරං ජානිතබ්බන්ති, ඛොමාදීනි ඡච්චීවරානි දුකූලාදීනි ඡ අනුලොම චීවරානි ජානිතබ්බානි ඉමානි ද්වාදස කප්පිය චීවරානි *—1 කුසචීවරං, 2 වාකචීවරං, † 3 කෙසකම්බලං, 4 පොත්ථකො, 5 චම්මං, 6 උලූකපක්ඛං, 7 රුක්ඛදුස්සං, 8 ලතාදුස්සං, 9 එරකදුස්සං, 10 කදලිදුස්සං, 11 වෙළුදුස්සන්ති, එවමාදීනිපන අකප්පිය චීවරානි—චීවරඛෙත්තන්ති—1 සංඝතොවා, 2 ගණතොවා, 3 ඤාතිතොවා, 4 මිත්තතොවා, 5 අත්තනො ධනෙන, 6 පංසුකූලං වාති, එවං උප්පජ්ජනතො ඡඛෙත්තානි අට්ඨන්නං මාතිකානං වසෙන අට්ඨඛෙත්තානි ජානිතබ්බානි,—පංසුකූලන්ති 1 සොසානිකං, 2 පාපණිකං, 3 රථියං 4 සඞ්කාරකූටකං 5 සොත්ථියං, 6 න්හානචොළං, 7 තිත්ථචොළං, 8 ගතපච්චාගතං, 9 අග්ගිදඩ්ඪං, 10 ගොඛායිතං, 11 උප

---

* ඛොමං කොසෙය්‍ය කප්පාසං, සාණභඞ්ගානි කම්බලං
කප්පියානි ඡළෙතානි, සානුලොමානි ජාතිතො
දුකූලඤ්චෙව පත්තුණ්ණං පට්ටං සොමාරචීනජං
ඉද්ධිජං දෙවදින්නංච තස්ස තස්සානුලොමිකා—ඉතිඛුද්දසික්ඛායං.

† 'එලකචීවර' මිතිපි පාඨො දිස්සති—

චිකාඛායිතං, 12 උන්දූරඛායිතං, 13 අන්තච්ඡින්නං, 14 දසච්ඡින්නං, 15 ධජාහටං, 16 ථූපං, 17 සමණචීවරං, 18 සාමුද්දියං, 19 අභිසෙකියං, 20 පන්ථිකං, 21 වාතාහටං, 22 ඉද්ධිමයං, 23 දෙවදත්තියන්ති,, තෙවීසති පංසුකූලානි වෙදිතබ්බානි.—එත්ථ සොත්ථියන්ති,, ගබ්භමලහරණං, ගතපච්චාගතන්ති, මතසරීරං පාරුපිත්වා සුසානං නෙත්වා ආනීතචීවරං "ධජාහටන්ති" ධජං උස්සාපෙත්වා තතො ආනීතං'ථූපන්ති, වම්මිකෙ පූජිතචීවරං 'සාමුද්දියන්ති' සමුද්ද වීචීථලෙපනීතං 'පන්ථිකන්ති' පන්ථං ගච්ඡන්තෙහි චොරභයෙන පාසාණෙහි කොට්ටෙත්වා පාරුපිතචීවරං, ඉද්ධිමයන්ති, එහිභික්ඛුචීවරං සෙසං පාකටමෙව; චීවරසන්තොසොති, වීසති චීවරසන්තොසා චීවරෙ විතක්කසන්තොසො 2 ගමනසන්තොසො, 3 පරියෙසනසන්තොසො 4 පටිලාභසන්තොසො, 5 මත්තපටිග්ගහණසන්තොසො, 6 ලොලුප්පවිවජ්ජනසන්තොසො, 7 යථාලාභසන්තොසො, 8 යථාබලසන්තොසො 9 යථාසාරුප්පසන්තොසො, 10 උදකසන්තොසො, 11 ධොවනසන්තොසො, 12 කරණසන්තොසො, 13 පරිමාණසන්තොසො, 14 සුත්තසන්තොසො. 15 සිබ්බනසන්තොසො 16 රජනසන්තොසො 17 කප්පසන්තොසො 18 පරිභොගසන්තොසො, 19 සන්නිධිපරිවජ්ජනසන්තොසො 20 විස්සජ්ජනසන්තොසොති—තත්ථ සාදක භික්ඛුනා තෙමාසං නිබද්ධවාසං වසිත්වා මාසමත්තං විතක්කෙතුං වට්ටති, සො හි පවාරෙත්වා චීවරමාසෙ චීවරං කරොති—පංසුකූලිකො අද්ධමාසෙනෙව කරොති—ඉති මාසද්ධමාසමත්තං විතක්කනං විතක්කසන්තොසො නාම තෙනපනසන්තුට්ඨෙන භික්ඛුනා පාචීනඛණ්ඩරාජිවාසිපංසුකූලිකත්ථෙරසදිසෙන භවිතබ්බං—ථෙරො කිර වෙතිය පබ්බතවිහාරෙ චෙතියං වන්දිස්සාමී'ති ආගතො චෙතියං වන්දිත්වා චින්තෙසි මය්හං චීවරං ජිණ්ණං බහූනං වසනට්ඨානෙ ලභිස්සාමීති, සො මහාවිහාරං ආගන්ත්වා සංඝත්ථෙරං දිස්වා වසනට්ඨානං පුච්ඡිත්වා තත්ථවුත්ථො පුනදිවසෙ චීවරං ආදාය ආගන්ත්වා ථෙරං වන්දි—ථෙරො කිං ආවුසො'ති ආහ, ගාමද්වාරං භන්තෙ ගමිස්සාමීති, අහම්පාවුසො ගමිස්සාමී'ති, සාධු භන්තෙ'ති, ගච්ඡන්තො මහාබොධිද්වාර කොට්ඨකෙ ඨත්වා පුඤ්ඤවන්තානං වසනට්ඨානෙ මනාපං ලභිස්සාමී'ති, චින්තෙත්වා අපරිසුද්ධො මෙ විතක්කොති' තතොපටිනිවත්ති— පුනදිවසෙ පනථ මහානසමීපං ගතො, පුනදිවසෙ මහාචෙතියස්ස උත්තරද්වාරතොතත්ථෙ'ව පටිනිවත්තිත්වා, චතුත්ථදිවසෙ'පි ථෙරස්සසමීපං අගමාසි—ථෙරො ඉමස්ස භික්ඛුනො විතක්කො න පරිසුද්ධො භවිස්සතී'ති, චීවරං ගහෙත්වා තෙන සද්ධිංයෙ'ව පඤ්හං පුච්ඡමානො ගාමං පාවිසි—තඤ්ච රත්තිං එකො මනුස්සො උච්චාරපළිබුද්ධො සාටකෙ යෙ'ව වච්චං කත්වා තං සංකාරට්ඨානෙ ඡඩ්ඩෙසි—පංසුකූලිකත්ථෙරො තං නීලමක්ඛිකාහි සම්පරිකිණ්ණං දිස්වා, අඤ්ජලිං පග්ගහෙසි 'මහාථෙරො කිං ආවුසො 'සංකාරට්ඨානස්ස අඤ්ජලිං පග්ගණ්හාසීති නාහං භන්තෙ සංකාරට්ඨානස්ස අඤ්ජලිං පග්ගණ්හාමි, මය්හං පිතුදසබලස්ස

පග්ගණ්හාමී පුණ්ණදාසියා පාරුපිත්වා ඡඩ්ඩිත පංසුකූලං තුම්බමත්තෙහි පා
ණෙ විධූනෙත්වා සුසානතො ගණ්හන්තෙන දුක්කරං කතං භන්තෙ'ති
මහාථෙරො පරිසුද්ධභාවිතත්තො පංසුකූලි කස්සා'ති චින්තෙසි—පංසුකූලි
කත්ථෙරො' පිතස්මිංයෙවඨානෙනිසින්නො විපස්සනං වඩ්ඪෙත්වා, තීණිඵලා
නිපත්වාතං සාටකං ගහෙත්වා, චීවරං කත්වා, පාරුපිත්වා, පාචීනඛණ්ඩ
රාජිං ගන්ත්වා, අග්ගඵලං අරහත්තං පාපුණි—චීවරත්ථාය ගච්ඡන්තස්ස පන
කත්ථලභිස්සාමී'ති අචින්තෙත්වා කම්මට්ඨානසීසෙනෙ'ව ගමනං, ගමන
සන්තොසො නාම—පරියෙසන්තස්ස පන යෙනවා තෙනවා සද්ධිං අපරියෙසි
ත්වා, ලජ්ජිං පෙසලං භික්ඛුං ගහෙත්වා පරියෙසනං පරියෙසන සන්තොසො
නාම, එවං පරියෙසන්තස්ස ආහරියමානං චීවරං දූරතො'ව දිස්වා, එතං
මනාපං භවිස්සති, එතං අමනාප'න්ති අවිතක්කෙත්වා, ථූලසුඛුමාදීසු යථාල
ද්ධෙනෙ'ව සන්තුස්සනං පටිලාභසන්තොසො නාම, එවං ලද්ධං ගණ්හන්ත
ස්සා'පි එත්තකං දුපට්ටස්ස එත්තකං එකපට්ටස්සා'ති අත්තනො පහොන
කමත්තෙනෙ'ව සන්තුස්සනං මත්තපටිග්ගහණසන්තොසො නාම; චීව
රං පරියෙසන්තස්ස පන අසුකස්ස ඝරද්වාරෙ මනාපං ලභිස්සාමී'ති අචින්තෙ
ත්වා ද්වාරපටිපාටියා චරණං, ලොලුප්පවිවජ්ජන සන්තොසො නාම; ලූඛප්ප
ණීතෙසු යෙන කෙනචියාපෙතුං සක්කොන්තස්ස යථාලද්ධෙනෙ'ව යාප
නං යථාලාභ සන්තොසො නාම, අත්තනො ථාමං ජානිත්වා, යෙන යාපෙතුං
සක්කොති, තෙන යාපනං යථාබලසන්තොසො නාම, මනාපං අඤ්ඤස්ස දත්වා
අත්තනො යෙන කෙනචි යාපනං යථාරූප්පසන්තොසො නාම; කත්ථ උදකං
මනාපං කත්ථ අමනාප'න්ති අවිචාරෙත්වා යෙන කෙනචි ධොවනූපගෙන
උදකෙන ධොවනං උදක සන්තොසො නාම, පණ්ඩුමත්තිකගෙරුකපූතිප
ත්තරසකිලිට්ඨානි පන උදකානි වජ්ජෙතුං වට්ටති—ධොවන්තස්ස පන මුග්ග
රාදීහි අපහරිත්වා හත්ථෙහි මද්දිත්වා ධොවනං ධොවන සන්තොසො නාම;
තථා අසුජ්ඣන්තං පණ්ණානි පක්ඛිපිත්වා තාපිත උදකෙනා'පි ධොවිතුං වට්ට
ති, එවං ධොවිත්වා කරොන්තස්ස ඉදං ථූලං ඉදං සුඛුම'න්ති අකොපෙත්වා
පහොනකනීහාරෙනෙ'ව කරණං කරණසන්තොසො නාම; තිමණ්ඩලපටි
ච්ඡාදනමත්තස්සෙ'ව, කරණං පරිමාණසන්තොසො නාම; චීවරකරණ
ත්ථාය පන මනාපං සුත්තං පරියෙසාමී'ති, අවිචාරෙත්වා, රථිකාදීසු වා දෙව
ට්ඨානෙ වා ආහරිත්වා පාදමූලෙ වා ඨපිතං යංකිඤ්චි දෙවසුත්තං ගහෙත්වා,
කරණං සුත්තසන්තොසො නාම; කුසිබන්ධනකාලෙ පන අඞ්ගුලමත්තෙ
සත්තවාරෙන විජ්ඣිතබ්බං, එවං කරොන්තස්සහි යොභික්ඛු සහායො න
හොති තස්සවත්තභෙදො'පිනත්ථි—තිවඞ්ගුලමත්තෙ පන සත්තවාරෙ
විජ්ඣිතබ්බං එවං කරොන්තස්ස මග්ගපටිපන්නෙනා'පි සහායෙන භවිත
බ්බං—සො න හොති තස්සවත්තභෙදො, අයං සිබ්බනසන්තොසො නාම, රජ
න්තෙන පන කාලකච්ඡාදීනි පරියෙසන්තෙන න චරිතබ්බං—සොමවක්කලා
දීසු යං ලභති, තෙන රජිතබ්බං—අලභන්තෙන පන මනුස්සෙහි අරඤ්ඤෙ වා

කං ගහෙත්වා, ඡඩ්ඩිතරජනං වා, භික්ඛූහි පචිත්වා ඡඩ්ඩිතකසාවං වා ගහෙත්වා රජ්ජිතබ්බං—අයං රජනසන්තොසො නාම, නීලකද්දමකාළ සාමෙසු යං කිඤ්චි ගහෙත්වා, හත්ථිපිට්ඨෙ නිසින්නස්ස පඤ්ඤායමානකප්ප කරණං කප්පසන්තොසො නාම, හිරිකොපීන පටිච්ඡාදන මත්තවසෙන පරිභුඤ්ජනංපරිභොග සන්තොසො නාම, දුස්සං පන ලභිත්වා, සුත්තං වා සූචිං වා කාරකං වා අලභන්තෙන ඨපෙතුං වට්ටති—ලභන්තෙන නවට්ටති—කත'මපි සචෙ අන්තෙවාසිකාදීනං දාතුකාමො හොති, තෙච, අසන්නිහිතා යාව ආගමනා ඨපෙතුං වට්ටති, ආගතමත්තෙසු දාතබ්බං දාතුං අසක්කොන්තෙන අධිට්ඨාතබ්බං අඤ්ඤස්මිං චීවරෙ සතිපච්චය ථිරතමිපි අධිට්ඨාතුංවට්ටති අනධිට්ඨිතමෙව හි සන්නිධි හොති, අධිට්ඨිතං නහොති'ති මහාසීවත්ථෙරො ආහ, අයංසන්නිධිපරිවජ්ජන සන්තොසො නාම—විස්සජ්ජන්තෙන නපනමුඛං ඔලොකෙත්වා, දාතබ්බං, සාරාණීයධම්මෙ ඨත්වා, විස්සජ්ජෙතබ්බ'න්ති අයං විස්සජ්ජනසන්තොසො නාම—චීවරපටිසංයුත්තානි ධුතඞ්ගානි, පංසුකූලිකඞ්ගඤ්චෙව තෙචීවරිකඞ්ගඤ්ච, තෙසං විත්ථාරකථා විසුද්ධිමග්ගතො වෙදිතබ්බා—ඉති චීවරසන්තොසංමහා අරියවංසං පූරයමානො භික්ඛු ඉමානි ද්වෙ ධුතඞ්ගානි ගොපෙති ඉමානි ගොපෙන්තො චීවරසන්තොස මහාඅරියවංස වසෙන සන්තුට්ඨො හොති—“වණ්ණවාදී,, එකො සන්තුට්ඨො හොති, සන්තොසස්සවණ්ණං න කථෙති, එකොනෙව සන්තුට්ඨො හොති, සන්තොසස්සවණ්ණං කථෙති, එකො නෙව සන්තුට්ඨො හොති, නෙවසන්තොසස්ස වණ්ණං කථෙති, එකොසන්තුට්ඨො හොති, සන්තොසස්සවණ්ණං කථෙති, තං දස්සෙතුං ඉතරීතර චීවරසන්තුට්ඨියාචවණ්ණ වාදීතිවුත්තං—අනෙසනන්ති දූතෙය්‍යපහිණගමනානුයොගප්පභෙදං නානප්පකාරංඅනෙසනං; අප්පතිරූපන්ති, අයුත්තං; අලද්ධාවා 'ති, අලභිත්වා, යථාඑකච්චො කථන්නුඛොචීවරං ලභිස්සාමී'ති, පුඤ්ඤවන්තෙහි භික්ඛූහි සද්ධිං එකතො හුත්වා, කොහඤ්ඤං කරොන්තො උත්තසති පරිතස්සති,, සන්තුට්ඨොභික්ඛු එවං අලද්ධාච චීවරං න පරිතස්සති—ලද්ධාචා 'ති, ධම්මෙන සමෙන ලභිත්වා; අගථිතො'ති, විගතලොභගිද්ධො—අමුච්ඡිතො'ති අධිමත්තතාය මුච්ඡං ආනාපන්නො; අනජ්ඣාපන්නොති; තණ්හාය අනොත්ථටො අපරියොනද්ධො; ආදීනවදස්සාවී'ති, අනෙසනාපත්තියඤ්ච ගථිත පරිභොගෙච ආදීනවං පස්සමානො; නිස්සරණපඤ්ඤො'ති, යාවදෙව සීතස්ස පටිඝාතායා'ති, වුත්තනිස්සරණමෙ'ව ජානන්තො; ඉතරීතරචීවර සන්තුට්ඨියාති; යෙන කෙනචි චීවරෙන සන්තුට්ඨියා, නෙව තත්‍ථානුක්කංසෙති 'ති, අහංපංසුකූලි කො,මයා උපසම්පදමාලකෙයෙවපංසුකූලිකඞ්ගං ගහිතං කොමයා සදිසොඅත්ථී'ති, අත්තුක්කංසනං නකරොති, නොපරං වම්භෙති 'ති, ඉමෙපනඤ්ඤෙ භික්ඛු නපංසුකූලිකා'වාති පංසුකූලිකමත්තම්පි එතෙසං නත්ථී 'ති, එවං පරං නවම්භෙති. යොහිතත්ථදක්ඛො 'ති, යොතස්මිං චීවරසන්තොස වණ්ණවාදිතාදී සුවාදක්ඛො ඡෙකොබ්‍යත්තො—අනලසො 'ති, සාතච්ච කිරියාය ආලසිය විරහිතො;

සම්පජානොපතිස්සතො'ති, සම්පජා න පඤ්ඤාය චෙවසතියාචයුත්තො; අරි
යවංසෙ ඨිතොති 2 අරියවංසෙප තිට්ඨිතො;—"ඉතරී තරෙන පිණ්ඩපාතෙ
නා' ති,, යෙනකෙනචි පිණ්ඩපාතෙන; එත්ථාපි 1 පිණ්ඩපාතො ජානිතබ්බො,
2 පිණ්ඩපාතඛෙත්තං ජානිතබ්බං, 3, පිණ්ඩපාත සන්තොසො ජානිතබ්බො,
4 පිණ්ඩපාත පටිසංයුත්ත ධුතඞ්ගානි ජානිතබ්බානි—තත්ථ පිණ්ඩපාතො'ති,
1 ඔදනො, 2, කුම්මාසො, 3, සත්තු, 4, මච්ඡො, 5, මංසං, 6, ඛීරං,
7, දධි, 8, සප්පි, 9, නවනීතං, 10, තෙලං, 11, මධු, 12, ඵාණිතං,
13, යාගු, 14, ඛාදනීයං, 15, සායනීයං, 16, ලෙහනීයන්ති, සොළස
පිණ්ඩපතා, පිණ්ඩපාතා ඛෙත්තානි,, 1, සංඝභත්තං, 2, උද්දෙස භත්තං, 3
නිමන්තනං, 4, සලාකභත්තං, 5, පක්ඛිකං 6, උපොසථිකං 7, පාටිපදිකං 8, ආ
ගන්තුකභත්තං 9, ගමිකභත්තං 10 ගිලානභත්තං 11, ගිලානුපට්ඨාකභත්තං
12, ධුරභත්තං 13, කුටිභත්තං 14, වාරභත්තං 15, විහාරභත්තන්ති, පණ්ණ
රස පිණ්ඩපාත ඛෙත්තානි—පිණ්ඩපාත සන්තොසො' ති,, 1 පිණ්ඩපාතෙ'වි
තක්කසන්තොසො 2, ගමනසන්තොසො 3, පරියෙසනසන්තොසො 4,
පටිලාභසන්තොසො 5, පටිග්ගහණසන්තොසො 6, මත්තපටිග්ගහණ
සන්තොසො 7 ලොළුප්පවිවජ්ජනසන්තොසො 8, යථාලාභසන්තොසො 9
යථාබලසන්තොසො 10, යථාසාරුප්පසන්තොසො 11, උපකාරසන්තො
සො 12 පරිමාණසන්තොසො 13, පරිභොගසන්තොසො 14, සන්නිධිපරි
වජ්ජනසන්තොසො 15, විස්සජ්ජනසන්තොසො' ති, පණ්ණරසන්තොසා—
තත්ථසාධුකභික්ඛුමුඛංධොවිත්වා, විතක්කෙති, පිණ්ඩපාතිකෙනපනගණ්හිත
සද්ධිංචරතාසායංථෙරූපට්ඨාන කාලෙයෙවකත්ථපිණ්ඩාය චරිස්සාමා' ති, අසු
ක ගාමෙහන්තෙ' ති, එත්තකං විතක්කෙත්වා, තතොපට්ඨාය නවිතක්කෙතබ්
බං—එකචාරිකෙන විතක්කමාල කෙවේත්වා, විතක්කෙතබ්බං—තතොපට්ඨා
ය විතක්කෙන්තො අරියවංසාචුතොහො' ති, පරිපාහිරො, අයං විතක්ක
සන්තොසොනාම, පිණ්ඩාය චරන්තෙන පත්තුකිං ලච්ඡිස්සාමී 'ති, අචිං
තෙත්වා කම්මට්ඨානසීසෙනගන්තබ්බං, අයංගමනසන්තොසො නාම—පරි
යෙසන්තෙනතයංචාතංවා අගහෙත්වා, ලජ්ජිපෙසල මෙවගහෙත්වා, පරියෙසි
තබ්බං, අයං පරියෙසනසන්තොසො නාම—දූරතො'ව ආහරියමානං දිස්වා,
එතං මනාපං එතං අමනාපන්ති, චිත්තං න උප්පාදෙ තබ්බං, අයංපටිලාභ ස
න්තොසොනාම—ඉදං මනාපං ගණ්හිස්සාමි, ඉදං අමනාපං නගණ්හිස්සාමී'ති,
අචින්තෙත්වා'යං කිඤ්චියාපනමත්තං ගහෙතබ්බමෙ'ව අයං පටිග්ගහණ
සන්තොසො නාම—එත්ථපනදෙය්‍ය ධම්මො බහු, දායකො අප්පංදාතු කා
මො, අප්පං ගහෙතබ්බං; දෙය්‍යධම්මො බහු දායකොපි බහුං දාතුකා
මො පමාණෙන ගහෙ තබ්බං දෙය්‍යධම්මො න බහු, දායකොපි අප්පං දාතු
කාමො අප්පං ගහෙතබ්බං; දෙය්‍යධම්මො න බහු, දායකො පන බහුං දාතු
කාමො පමාණෙන ගහෙතබ්බං; පටිග්ගහණ සම්ඃහිමත්තං අජානන්තො
මනුස්සානං පසාදංමක්ඛෙති, සද්ධාදෙය්‍යං විනිපාතෙති, සාසනං නකරොති

විජාත මාතුයාපි චිත්තං ගණ්හෙතුංනසක්කොන්ති, ඉතිමත්තං ජානිත්වාව පටිග්ගහෙතබ්බං අයම්පිත්ත පටිග්ගහණ සන්තොසො නාම–අඩ්ඪකුලානිපෙව අගන්ත්වා වාරපටිපාටියා ගන්තබ්බං—අයං ලොළුප්ප විවජ්ජන සන්තොසො නාම–යථාලාභසන්තොසො සාදයො චීවරෙවුත්තනයා යෙව පිණ්ඩපාතං පරිභුඤ්ජිත්වා, සමණධම්මං අනුපාලෙස්සාමී'ති., උපකාරං ඤත්වා පරිභුඤ්ජනං උපකාරසන්තොසො නාම–පත්තං පූරෙත්වා, ආනීතං න පටිග්ගහෙතබ්බං, අනුපසම්පන්නෙසති තෙනගාහාපෙතබ්බං අසතිහරාපෙත්වා පටිග්ගහණීරූහණමත්තං ගහෙතබ්බං, අයං පරිමාන සන්තොසොනාම–ජිඝච්ඡාය පටිවිනොදනං ඉදමෙත්ථනිස්සරණන්ති, එවං පරිභුඤ්ජනං පරිභොග සන්තොසොනාම, නිදහිත්වා නිදහිත්වාන පරිභුඤ්ජිතබ්බං, අයංසන්නිධි පරිවජ්ජන සන්තොසොනාම, මුඛංඅනොලොකෙත්වා, සාරාණීය ධම්මෙ ඨිතෙන විස්සජ්ජෙතබ්බං අයං විස්සජ්ජන සන්තොසොනාම පිණ්ඩපාත පටිසංයුත්තානිපන පඤ්චධුතඞ්ගානි, 1 පිණ්ඩපාතිකඞ්ගං 2 සපදානචාරිකඞ්ගං 3 එකාසනිකඞ්ගං 4 පත්තපිණ්ඩිකඞ්ගං 5 ඛලුපච්ඡාභත්තිකඞ්ග'න්ති, තෙසං විත්ථාරකථා විසුද්ධිමග්ගෙවුත්තා–ඉතිපිණ්ඩපාත සන්තොස මහාඅරියවංසං පූරයමානො භික්ඛු ඉමානි පඤ්චධුතඞ්ගානි ගොපෙති, ඉමානිගොපෙන්තො පිණ්ඩපාත සන්තොසමහා අරියවංසවසෙන සන්තුට්ඨොහොති–වණ්ණවාදී'ති' ආදිනිවුත්තනයෙනෙ'ව වෙදිතබ්බානි—සෙනාසනෙනා'ති, ඉධ, 1 සෙනාසනං ජානිතබ්බං 2 සෙනාසන ඛෙත්තං ජානිතබ්බං 3 සෙනාසන සන්තොසො ජානිතබ්බො—4 සෙනාසනපටිසං යුත්තධුතඞ්ගානි ජානිතබ්බානි—තත්ථ සෙනාසන'න්ති මඤ්චො—පීඨං—භිසි—බිම්බොහනං—විහාරො–අඩ්ඪයොගො—පාසාදො—හම්මියං—ගුහා—ලෙනං—අට්ටො—වෙළුගුම්බො–රුක්ඛමූලං—යත්ථවාපනභික්ඛුපටික්කමන්ති තිඉමානි පණ්ණරස සෙනාසනානි–සෙනාසනඛෙත්ත'න්ති 1, සංඝතොවා, 2, ගණතොවා–3, ඤාතිතොවා, 4, මිත්තතොවා, 5, අත්තනොවාධනෙන, 6, පංසුකූලංවා'ති, ඡඛෙත්තානි–"සෙනාසනසන්තොසො 'ති" සෙනාසනෙ විතක්කසන්තොසා සාදයොපණ්ණරසසන්තොසා" තෙපිණ්ඩපාතෙ වුත්තනයෙනෙව වෙදිතබ්බා–"සෙනාසන පටිසංයුත්තානිපඤ්ච ධුතඞ්ගානි–1, ආරඤ්ඤිකඞ්ගං 2, රුක්ඛමූලිකඞ්ගං–3, අබ්භොකාසිකඞ්ගං–4, සොසානිකඞ්ගං–5, යථාසන්තතිකඞ්ගන්ති තෙසං විත්ථාරකථා විසුද්ධිමග්ගෙ වුත්තා–ඉති සෙනාසන සන්තොස මහා අරියවංසං පූරෙයමානො භික්ඛු ඉමානි පඤ්ච ධුතඞ්ගානි ගොපෙති–ඉමානි ගොපෙන්තො සෙනාසනාසන සන්තොස මහාඅරියවංසවසෙන සන්තුට්ඨො හොති–ගිලානපච්චයො පන පිණ්ඩපාතෙයෙ'ව පවිට්ඨො තත්ථ යථාලාභ යථාබල යථාසාරුප්පසන්තොසෙනෙ'ව සන්තුස්සිතබ්බං–නෙසජ්ජිකඞ්ග භාවනාරාම අරියවංසං භජති'ති වුත්තම්පිචෙතං.

"පඤ්චසෙනාසනෙවුත්තා, පඤ්ච ආහාරනිස්සිතා,
එකොවිරියසඤ්ඤුත්තො, ද්වෙචීවරනිස්සිතා'ති."

ඉති භගවා පඨවිං පත්ථරමානො විය සාගරකුච්ඡිං පූරයමානො විය, ආකාසං විත්ථාරයමානො විය ච පඨමං චීවරසන්තොස අරියවංසං කථෙත්වා චන්දං උට්ඨාපෙන්තො විය සූරියං උල්ලඞ්ඝෙන්තො විය දුතියං පිණ්ඩපාතසන්තොස කථෙත්වා, සිනෙරුං උක්ඛිපන්තො විය ච තතියං සෙනාසනසන්තොසං අරියවංසං කථෙත්වා, ඉදානි සහස්සනය පටිමණ්ඩිතං චතුත්ථං භාවනාරාම අරියවංසං කථෙතුං "පුනචපරං භික්ඛවෙ භික්ඛු භාවනා රාමො හොතී" ති දෙසනං ආරභි.

තත්ථ ආරමනං ආරාමො, අභිරමතී" ති අත්ථො, භාවනාය ආරාමො අස්සා'ති භාවනාරාමො, භාවනාය රතො'ති භාවනාරතො, පඤ්චවිධෙ පහානෙ ආරාමො අස්සාති පහානාරාමො, අපිච භාවෙන්තො රමතී'ති, භාවනාරාමො, පජහන්තො රමතී'ති, පහානාරාමො'ති, එවමෙත්ථ අත්ථො දට්ඨබ්බො—අයං හි චත්තාරො සතිපට්ඨානෙ භාවෙන්තො රමති, රතිං වින්දති'ති අත්ථො—තථා චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්චබලානි සත්තබොජ්ඣඞ්ගෙ සත්ත අනුපස්සනා අට්ඨාරස මහා විපස්සනා සත්තතිංස බොධිපක්ඛිය ධම්මෙ අට්ඨතිංස ආරම්මණ විභත්තියො භාවෙන්තො රමතිරතිං වින්දතීති කාමච්ඡන්දාදයො පන කිලෙසෙ පජහන්තො රමතිරතිං වින්දතීති—ඉමෙසු පන චතූසු අරියවංසෙසු පුරිමෙහි තීහි තෙරසන්නං ධුතඞ්ගානං චතුපච්චය සන්තොසස්ස ච වසෙන සකලං විනයපිටකං කථිතං හොති, භාවනාරාමෙන අවසෙස පිටකද්වයං—ඉමං පන භාවනාරාමං අරියවංසං කථෙන්තෙන භික්ඛුනා පටිසම්භිදා මග්ගෙ නෙක්ඛම්මපාළියා කථෙතබ්බං—දීඝනිකායෙ දසුත්තර සුත්තන්තපරියායෙන කථෙතබ්බං—මජ්ඣිමනිකායෙ සතිපට්ඨානසුත්තන්ත පරියායෙන කථෙතබ්බං—අභිධම්මෙ නිද්දෙසපරියායෙන කථෙතබ්බං—තත්ථ "පටිසම්භිදා මග්ගෙ නෙක්ඛම්ම පාළිය'න්ති" නෙක්ඛම්මං භාවෙන්තො රමති කාමච්ඡන්දං පජහන්තො රමති, අබ්‍යාපාදං—බ්‍යාපාදං—ආලොකසඤ්ඤං—ථීනමිද්ධං—අවික්ඛෙපං—උද්ධච්චං—ධම්ම වවත්ථානං—විචිකිච්ඡං—ඤාණං—අවිජ්ජං—පාමොජ්ජං—අරතිං—පඨමජ්ඣානං—පඤ්ච නීවරණෙ—දුතියජ්ඣානං—විතක්කවිචාරෙ—තතියජ්ඣානං—පීතිං—චතුත්ථජ්ඣානං—සුඛදුක්ඛ ආකාසානඤ්චායතන සමාපත්තිං භාවෙන්තො රමති, රූපසඤ්ඤං, පටිඝසඤ්ඤං, නානත්තසඤ්ඤං පජහන්තො රමති—විඤ්ඤාණඤ්චායතන සමාපත්තිං—පෙ—නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිං භාවෙන්තො රමති, ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤං පජහන්තො රමති, අනිච්චානුපස්සනං භාවෙන්තො රමති—නිච්චසඤ්ඤං පජහන්තො රමති—දුක්ඛානුපස්සනං, සුඛසඤ්ඤං—අනත්තානුපස්සනං, අත්තසඤ්ඤං, නිබ්බිදානුපස්සනං, නන්දිං, විරාගානුපස්සනං, රාගං, නිරොධානුපස්සනං, සමුදයං, පටිනිස්සග්ගානුපස්සනං, ආදානං, ඛයානුපස්සනං, ඝනසඤ්ඤං—වයානුපස්සනං—ආයූහනං—විපරිණාමානුපස්සනං—ධුවසඤ්ඤං—අනිමිත්තානුපස්සනං—නිමිත්තං, අප්පණිහිතානුපස්ස

නං, පණිධිං, සුඤ්ඤතානුපස්සනං, අභිනිවෙසං, අධිපඤ්ඤාධම්මවිපස්සනං, සාරාදානාභිනිවෙසං, යථාභූතඤාණදස්සනං, සම්මොහාභිනිවෙසං, ආදීනවානුපස්සනං, ආලයාභිනිවෙසං, පටිසංඛානුපස්සනං, අප්පටිසංඛං, විවට්ටානුපස්සනං, සංයොගාභිනිවෙසං, සොතාපත්තිමග්ගං, දිට්ඨෙකට්ඨෙකිලෙසෙ, සකදාගාමිමග්ගං, ඔළාරිකෙකිලෙසෙ, අනාගාමිමග්ගං, අනුසහගතෙකිලෙසෙ, අරහත්තමග්ගං භාවෙන්තො රමති සබ්බකිලෙසෙ පජහන්තො රමතී'ති එවං පටිසම්භිදා මග්ගෙ නෙක්ඛම්ම පාළියා කථෙතබ්බං.

දීඝනිකායෙ දසුත්තර සුත්තන්ත පරියායෙනා'ති එකං ධම්මං භාවෙන්තො රමති, එකං ධම්මං පජහන්තො රමති–පෙ–දසධම්මෙ භාවෙන්තො රමති, දසධම්මෙ පජහන්තො රමති, කතමං එකං ධම්මං භාවෙන්තො රමති, කායගතාසතිං සාතසහගතං ඉමං එකං ධම්මං භාවෙන්තො රමති–කතමං එකං ධම්මං පජහන්තො රමති—අස්මිමානං, ඉමං එකං ධම්මං පජහන්තො රමති–කතමෙ ද්වෙ ධම්මෙ—පෙ—කතමෙ දසධම්මෙ භාවෙන්තො රමති–දසකසිණායතනානි–ඉමෙ දසධම්මෙ භාවෙන්තො රමති–කතමෙ දසධම්මෙ පජහන්තො රමති–දසමිච්ඡත්තා–ඉමෙ දසධම්මෙ පජහන්තො රමති–එවං ඛො භික්ඛවෙ භික්ඛුභාවනා රාමො හොතී'ති එවං දීඝනිකායෙ දසුත්තරසුත්තන්ත පරියායෙන කථෙතබ්බං.

මජ්ඣිමනිකායෙ සතිපට්ඨානසුත්තන්ත පරියායෙනා'ති,–එකායනො අයං භික්ඛවෙ මග්ගො–පෙ–යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති න ච කිඤ්චි ලොකෙ උපාදියති එවම්පි භික්ඛවෙ භික්ඛු භාවනාරාමො හොති, භාවනාරතො පහාණාරාමො හොති පහාණරතො–පුනචපරං භික්ඛවෙ භික්ඛු ගච්ඡන්තො වා ගච්ඡාමී'ති පජානාති—පෙ—පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං—පෙ—පූතිකානි චුණ්ණකජාතානි සො ඉමමෙව කායං උපසංහරති, අයම්පි ඛො කායො එවං ධම්මො එවං භාවී එතං අනතීතො'ති, ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති,—පෙ—එවං ඛො භික්ඛවෙ භික්ඛු භාවනාරාමො හොති'ති, එවං මජ්ඣිමනිකායෙ සතිපට්ඨානසුත්තන්තපරියායෙන කථෙතබ්බං.

අභිධම්මෙ නිද්දෙසපරියායෙනා'ති සබ්බෙ'පි සඞ්ඛතෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො රොගතො ගණ්ඩතො—පෙ—සංකිලෙසිකතො පස්සන්තො රමති, එවං ඛො භික්ඛවෙ භික්ඛු භාවනාරාමො හොතී'ති, එවං නිද්දෙස පරියායෙන කථෙතබ්බං.

නෙවත්තානුක්කංසෙතී'ති අජ්ජමෙ සට්ඨිංවාසත්ත තිංවාවස්සානි අනිච්චං දුක්ඛං අනත්තා'ති විපස්සනාය කම්මං කරොන්තස්ස කොමයාසදිසො අත්ථී'ති, එවං අත්තුක්කංසනං නකරොති, නොපරං වම්භෙති'ති අනිච්චං දුක්ඛ'න්ති විපස්සනාමත්තකම්පි නත්ථි, කිං ඉමෙ විස්සට්ඨකම්මට්ඨානාචර [illegible] එවං පරවම්භනං නකරොති සෙසං වුත්තනයමෙ'ව

ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අරියවංසා'ති භික්ඛවෙ ඉමෙ චත්තා-
රො අරියවංසා, අරියතන්තියො, අරියපවෙණියො, අරියඤ්ඤසා අරියවඩ්ඪ-
මානී'ති සුත්තන්තං විනිවට්ටෙත්වා ඉදානි මහා අරියවංස පරිපූරකස්ස
භික්ඛුනො වසනදිසාදස්සනෙන ඉමෙහිච පන භික්ඛවෙ'ති ආදි-
මා'හ, තත්ථ, සෙව'ච අරතිංසහතී'ති සො යෙව අරතිං අනභිරතිං උක්ක-
ණ්ඨිතං සහති අභිභවති නතං අරති සහතී'ති තමපන භික්ඛුං යා'එසා
පන්තෙසු සෙනාසනෙසු අධිකුසලානංවා ධම්මානං භාවනාය අරත්නාම
හොති, සාසහිතුං අභිභවිතුං නසක්කොති–අරතිරතිසහොති අරතිඤ්ච පඤ්ච
කාමගුණරතිඤ්ච සහති, අභිභවිතුං සක්කොති–ඉදානි ගාථාහි කූටං ගණ්හ-
න්තො නාරතී'ති ආදිමාහ——

තත්ථ, ධීර'න්ති විරියවන්තං, නාරතිධීරසංහත්'ති ඉදං පුරිමස්සකාරණ-
වචනං යස්මා සාවීරසංහති නහොති, වීරංසහිතුං අභිභවිතුං නසක්කොති;
තස්මා නාරතිසහති ධීරං, ධීරොහි අරතිං සහො'ති අරතිසහනතොහි සො
ධීරො නාම–තස්මා අරතිං සහති'ති අත්ථො; සබ්බකම්මවිනාසිත'න්ති
සබ්බං තෙභූමකං කම්මං වජිත්වා පරිච්ඡිනනං පරිවටුමං කත්වා ඨිතං, පනු-
න්නංකො නිවාරයෙ'ති කිලෙසෙ පනුදිත්වා ඨිතං, කොනාමරාගොවා
දොසොවා නිවාරෙය්‍ය "නෙක්ඛං ජම්බොනදස්සෙ'ව කොතං නින්දිතු-
මරහති'ති, ජම්බොනදසංඛාතස්සජාතිං රත්තසුවණ්ණස්සනෙක්ඛස්සදිසං ගර-
හිතබ්බදොස විනිම්මුත්තංකොතංපුග්ගලං නින්දිතුං අරහති බ්‍රහ්මුනාපිපසංසි-
තො'ති මහාබ්‍රහ්මුනා'පි එසො පුග්ගලො පසංසිතොයෙ'වා'ති–දෙසනා පරි-
යොසානෙ චත්තාරීසං භික්ඛුසහස්සානි අරහත්තෙ පතිට්ඨහිංසු.

අරියවංසසුත්තට්ඨකථා නිට්ඨිතා——

# ආර්‍ය්‍යවංශ සූත්‍ර සන්නය.

**නමො තස්ස**
**භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

මම, මාවිසින් (මේ ආර්‍ය්‍යවංශ සූත්‍රාන්ත ධර්‍මදෙශනාව); එවං සුතං, මෙසේ අසනලදී; (කොහොත්) මෙ, මාගේ; සුතං, (ශ්‍රොත්‍රවිඥානය පූර්‍වාංගමවූ විඥාණවීථියෙන්) ඇසීම; එවං, මෙසේමැයි; (ඒ කෙසේද) එකංසමයං (ගර්‍භාවක්‍රාන්තිසමයාදී සමයන්අතුරෙන් කරුණාකෘත්‍යසමය සංඛ්‍යාතවූ) එක් ධර්‍මදෙශනාසමයෙක්හි; භගවා, (රාගද්වෙෂමොහාදී සියලු පාපධර්‍මයන් භග්නකළහෙයින්) භාග්‍යවත්නම්වූ (සර්‍වඥරාජොත්තමයානන් වහන්සේ); සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, (ජෙතනම් රාජකුමාරයා විසින් රොපිත සංවර්‍ධිතහෙයින්) ජෙතවනනම්වූ; අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬුමහසිටුනුගේ ආරාමයෙහි; විහරති, (සතර බ්‍රහ්මවිහරණයෙන් යුක්තව) වැඩවාසයකරණසේක—තත්‍රඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවත්වූ සර්‍වඥරාජොත්තමයානන්වහන්සේ; භික්ඛවොති!, මහණෙනි කියා; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක; භදන්තෙති, ස්වාමීන්වහන්ස! කියා; තෙභික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවත්වූ සර්‍වඥයන්වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්නාහුය; භගවා, භාග්‍යවත්තෙමේ; එතං, මේ වක්ෂ්‍යමාන සූත්‍රය; අවොච, (මධුරස්වරයෙන්) දෙශනාකොට වදාළසේක; භික්ඛවෙ!, මහණෙනි; ඉමෙ චත්තාරො අරියවංසා, මේ සතර ආර්‍ය්‍යවංශයෝ; අග්ගඤ්ඤා, අග්‍රයයි දතයුත්තාහ; රත්තඤ්ඤා, බොහෝකල් පැවැත්තේයයි දතයුත්තාහ; වංසඤ්ඤා, (බුද්ධප්‍රත්‍යෙකබුද්ධ ආර්‍ය්‍යශ්‍රාවකයන්වහන්සේලාගේ) වංශයයි දතයුත්තාහ; පොරාණා, පෞරාණිකයයි දතයුත්තාහ; අසංකිණ්ණා, දුරුනොකරණ ලද්දාහ; අසංකිණ්ණපුබ්බා, (මෙයින් ප්‍රයොජන කවරේදැයි කියා අතීත බුද්ධාදී උත්තමයන් විසින්ද) පහනොකළවිරූය; නසංකීයන්ති, (දැනුදු මෙයින් ප්‍රයොජන කවරේද කියා) පහනොකෙරෙත්; නසංකියිස්සන්ති, (අනාගතයෙහි ඇතිවන්නාවූ බුද්ධාදී උත්තමයන් විසින්ද මෙයින් ප්‍රයොජන කවරේදැයි) පහනොකරණු ලබත්; විඤ්ඤූහි, නුවණැත්තාවූ; සමණෙහි, (සංසිඳුවනලද කෙලෙසුන් ඇති) ශ්‍රමණයන්විසින්ද; බ්‍රාහ්මණෙහි, (පහකරණලද කෙලෙසුන් ඇති) බ්‍රාහ්මණයන් විසින්ද; අප්පතිකුට්ඨා, ගර්හානොකරණලද්දාහ; කතමෙ චත්තාරො?, ඒ සතර ආර්‍ය්‍යවංශයෝ කවරහුද?

භික්ඛවෙ!, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, සසරභය දක්නා මහණතෙම; ඉතරීතරෙන චීවරෙන, (දළරුක්ෂාදි) ලත්ස්වභාවවූ සිවුරකින්; සන්තුට්ඨො හොති, (ත්‍රිවිධසන්තොෂයෙන්; නොහොත් විංශති ප්‍රකාරසන්තොෂයෙන්) සතුටුවන්නේවේද; මෙහි විංශති ප්‍රකාර සන්තොෂයෝ නම්. සිවුරෙහි විතක්කසන්තොෂය, ගමන සන්තොෂය, පරියේසණ සන්තොෂය, ප්‍රතිලාභ සන්තොෂය, පමණ්ඥන පිළිගන්නා සන්තොෂය, ලොළුප්පවිවජ්ජන සන්තොසය, යථාලාභ සන්තොසය, යථාබල සන්තොසය, යථාසාරුප්ප සන්තොසය, උදක සන්තොසය, ධෝවන සන්තොෂය. කරණ සන්තොසය, ප්‍රමාණ සන්තොෂය, සුත්ත සන්තොසය, සිබ්බන සන්තෝසය, රජන සන්තෝසය, කප්ප සන්තෝසය, පරිභොග සන්තෝෂය; සන්නිධිපරිවජ්ජන සන්තොෂය, විස්සජ්ජන සන්තොසය, යන මොහු වෙත්.—

මෙහි සිවුරු ඉවසන භික්ෂුව විසින් තෙමසක් නිබද වාසයකොට මසක් පමණ විතක්කයකරන්ට වටනේය—හෙතෙම වනාහි වස් පවරා චීවරමාසයෙහි සිවුරුකරන්නේය–පාංශුකූලිකතෙම අඩමාසයකින් සිවුරුකරන්නේය–මෙසේ මාසාඩ මාසයක් පමණ විතක්කයකිරීම විතක්ක සන්තෝෂයනම් වේ–මේ විතක්ක සන්තෝෂයෙන් යුක්තවූ භික්ෂුව විසින් පාචීනඛණ්ඩරාජිවාසී පාංශුකූලික මහතෙරුන්වහන්සේමෙන් වියයුතු.— ඒ තෙරුන්වහන්සේ වනාහි චෛත්‍යපර්වත විහාරයෙහි චෛත්‍යය වඳිමියි ආයේය, චෛත්‍යය වැඳ මාගේ සිවුරු දුර්වලව දිරාගියහෙයින් බොහෝදෙනා වාසයකරණ ස්ථානයෙහිදී මනාපවූ සිවුරු ලබමියි සිතූයේය. මෙසේ සිතා අනුරාධපුර මහාවිහාරයට අවුත් සංඝස්ථවිරයන්වහන්සේ දැක වාසය කරන්නාවූ ස්ථානයක් විචාරා එහි වාසයකොට දෙවෙනි දවසෙහි සිවුරු ගෙනැවුත් මහතෙරුන්වහන්සේ වැඳ සිටියේය. එවිට මහතෙරුන්වහන්සේ කිමෙක්ද ඇවැත්නියි විචාළේය–එවිට පාංශුකූලික තෙරුන්වහන්සේ ස්වාමීනි ගම්දොරට යෙමියි කියේය. මහතෙරුන්වහන්සේ ඇවැත්නී මමද යෙමියි කීයේය. පාංශුකූලික තෙරුන්වහන්සේද යහපත ස්වාමීන්වහන්සැයි කියා වඩනාසේක් මහබෝදොර කොටුවෙහිසිට පුණ්‍යවන්තයන් වාසයකරණ ස්ථානයෙහිදී මනොඥ සිවුරු ලබමියි සිතා නැවත මාගේ විතක්කය හෙවත් කල්පනාව අපිරිසිදුයයි එයින් නැවතුනේය. දෙවෙනි දවසෙහිද ගොස් එසේ නැවතී තුන්වෙනි දවසෙහිද මහා චෛත්‍යයට උතුරුදොර සමීපයට ගොස් එතැන්හිදීම නැවතී සතරවන දවසේද මහතෙරුන්වහන්සේගේ සමීපයට ආවේය. මහතෙරුන්වහන්සේද මේ භික්ෂූන්වහන්සේගේ විතක්කය අපිරිසිදුවන්නේයයි සිතා සිවුරු පොරවාගෙණ ඒ තම හා සමග ප්‍රශ්න විචාරමින් ගම්දොරට ප්‍රවිෂ්ටවූසේක. එමද රාත්‍රියෙහි එක්තරා මනුෂ්‍යයෙක් වචීසින් තිඹිවූ වස්ත්‍රයෙහිම වච්ස්කොට

එම වස්ත්‍රය සමග කසලැගොඩට දැමුවේය පාංශුකූලික තෙරුන්වහන්සේ කිලමැස්සන් විසින් පිරිවරණලද්දාවූ ඒ වස්ත්‍රය දැක දෙහොත් මුදුනෙහි තබා ඇඳිලිබැඳ සිටියේය. ඒ දුටු තෙරුන්වහන්සේ කිමෙක්ද ඇවැත්නි කසලගොඩට ඇඳිලිබඳින්නෙහිදැයි කීයේය. පාංශුකූලික තෙරුන්වහන්සේද ස්වාමීනි! මම කසලගොඩට ඇඳිලිනොබඳිමි. මාගේ පියවූ දසබලධාරීවූ බුදුරජාණන්වහන්සේට ඇඳිලිබඳිමි. ස්වාමීන්වහන්ස! "පූර්ණ නම්" දාසියට පොරවාදමනලද පාංශුකූලික වස්ත්‍රය තිඹක් * පමණ පණුවන්ගසා දමා සොහොනින්ගත්තාවූ උන්වහන්සේ විසින් අතිශයින් දුෂ්කරයක් කරණලද්දේයයි කීයේය. මේ විතක්ක සන්තෝෂයනම්වේ —

සිවුරුපිණිස යන්නහු විසින් වනාහි 'කවරතැනකදී ලැබේද්දෝහෝයි නොසිතා කම්ස්ථාන ශීර්ෂයෙන් යෑම ගමන සන්තෝසයනම්වේ—සිවුරු සොයා යන්නහු විසින් වනාහි යම් කිසිවක්හු හා සමග නොස් කොසොයා ලජ්ජිප්‍රිය ශීලී භික්ෂුවක් සමග ගොස් සෙවීම පර්යේෂණ සන්තෝෂයනම්වේ මෙසේ සොයන්නාහට ගෙණෙනු ලබන්නාවූ සිවුරක් දුරින්ම දැක මේ, සිවුර මනාපවන්නේය, මේ සිවුර අමනාපවන්නේයයි මෙසේ කල්පනා නොකොට දල සියුම් රූක්ෂ මෘදු මොලොක්වූද සිවුරු අතුරෙන් යම් කිසි ලැබුන සිවුරකින් සන්තුෂ්ටවීම ප්‍රතිලාභසන්තෝෂයනම්වේ— මෙසේ ලබනලද සිවුරු ගන්නහු විසින්ද මෙපමණෙක් දෙපට සිවුරට සෑහෙන්නේය, මෙපමණෙක් එකපට (සිවුර) ට සෑහෙන්නේයයි සිතා තමන් විසින් යම් කිසිවකින් යැපීම යථාසාරුප්‍ය සන්තෝසයනම්වේ— කවර තැනක ජලය යහපත්ද? කවර තැනක අයහපත්දැයි නොවිචාරා ධොවනයට සෑහෙන යම් කිසි ජලයකින් සේදීම උදක සන්තෝසයනම්වේ— මෙහි වනාහි පඬුවණී මැටියෙන් යුත් ජලය හා කිළිටු ජලයද දුරුකරන්ට වටනේය. සෝදන්නහු විසින් මුගුරු ආදියෙන් නොගසා අතින් පිරිමැද හෙවත් මදිනයකොට සේදීම ධොවන සන්තෝසයනම්වේ— එසේ සුධ නොවන්නේවීනම් කොල බහා උණුකරණලද ජලයෙන්ද සෝදන්ට වටනේය. මෙසේ සෝදූ සිවුරුකරන්නහු විසින් මේ දලය සිහින්යයි විකෝපනය නොකොට සෑහෙන්නාවූ ක්‍රමයෙන්ම කිරීම කරණ සන්තෝසයනම්වේ—ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනය පමණටම කිරීම පරිමාණ සන්තෝසයනම්වේ—සිවුරු මැසීම පිණිස වනාහි යහපත් නූල් සොයම්යි නොවිචාරා වීථි ආදියෙහි හෝ දෙවස්ථානයෙහි හෝ ගෙණවුත් පාමුල්හි තබනලද හෝ යම් කිසි නූල් වර්ගයක්ගෙණ කිරීම සූත්‍ර සන්තෝසයනම්වේ— එසේම සිවුරු කිරීම හෙවත් මැසීම සිබ්බන සන්තෝසයනම්වේ— රජන් කරන්නහු විසින් වනාහි සොමවක්කලාදීන් අතුරෙන් යමක් ලැබ එයින් රැඳිය යුතුය නොලබන්නහු විසින් වනාන්තරයෙහි මනුෂ්‍යයන් විසින් ගෙණ

* ලාස්සක් හෙවත් නැලි සතරක්.

හැරදමා ගිය කසට හෝ භික්ෂූන් විසින් පිය හැරදමනලද කසට හෝ ගෙණ රජන් කටයුත්තේය, මේ රජන සන්තෝසයනම්වේ.—නීල කෘෂ්ණාදිවූ යම් කිසිවක් ගෙණ හස්තිසකණ්ඩාදියෙහි උන්නාහට පෙණෙන් නාවූ පමණකට කප්බින්දු තැබීම කපස සන්තෝසයනම්වේ—ලජ්ජාස්ථානය ප්‍රතිච්ඡාදනය කිරීම පමණ වශයෙන් පරිභොගකිරීම පරිභොග සන්තෝසයනම්වේ—වස්ත්‍රයක් වනාහී ලැබ නූල් හෝ ඉදිකටු හෝ සිවුරු කරන්නකු හෝ නොලබන්නහු විසින් තබන්ට වටනේය. අධිෂ්ඨාන නොකලාවූ වස්ත්‍රය සන්නිධිවන්නේය. අධිෂ්ඨිත වස්ත්‍රය සන්නිධි නොවන්නේයයි මහා සීවස්ථවිරයන්වහන්සේ විසින් කියනලද්දේය—මේ සන්නිධි පරිවජ්ජන සන්තෝසයනම්වේ.—විසජ්ජනය කරන්නහු විසින් වනාහී මුහුණ බලා නොදියයුතු, සාරාණීය ධර්මයෙහි සිට විසජ්ජනය කටයුත්තේය. මේ විසජ්ජන සන්තෝෂයනම්වේ.—

'චීවර ප්‍රතිසංයුක්ත ධූතාඞ්ගනම්; පාංශුකූලිකාඞ්ගයද, තෙ චීවරිකාඞ්ගයද, යන මොහුයි. මෙහි විස්තර විශුද්ධිමාර්ගයෙන් දතයුතුයි. මෙසේ චීවර සන්තෝස මහා ආර්‍ය්‍යවංශය පුරණ්‍ය ලබන්නාවූ මහණතෙමේ මේ දෙවැදෑරුම් ධූතාඞ්ගයන් ගොපණය කරන්නේය, මේ ධූතාඞ්ගයන් ගොපණය කරන්නේ චීවර සන්තෝස ආර්‍ය්‍යවංශයෙන් සන්තුෂ්ටවන්නේනම් වේ.

(මෙසේ විංශති ප්‍රකාරවූ සන්තෝෂයෙන් සතුටුවන්නේ වේද) ඉතරීතර චීවර සන්තුට්ඨියාව, යම්සේ ලබනලද චීවරයකින් සතුටුවීමෙහි; * වණ්ණවාදී, ගුණ කියන සුළුවේද, (මෙහිදු ඇතම් කෙණෙක් තෙමේ චීවර සන්තෝසයෙන් සතුටුවන්නේය. එසේම සතුටුවූ අන්‍යයන්ගේ ගුණ නොකියන්නේය, ඇතැම් කෙණෙක් තමන්ද සතුටු නොවන්නේය. සන්තෝෂයෙන් යුක්තවූ අනුන්ගේ ගුණද නොකියන්නේය, ඇතැම් කෙණෙක් තෙමේද චීවර සන්තෝසයෙන් යුක්තවන්නේය. එම සන්තෝෂයෙන් යුක්තයාගේ ගුණද කියන්නේය.) චීවරහෙතු, සිවුරු පිණිස; අප්පතිරූපං, නුසුදුසුවූ; අනෙසනං, (දූතෙය්‍ය පහීණගමනානුයොගාදි ප්‍රභෙද නානාප්‍රකාර) අනෙව්ෂණයට; නච ආපජ්ජති, නොපැමිණේද; චීවරං, සිවුරක්; අලඞාච, නොලැබද; නපරිතස්සති, ත්‍රස්ත නොවන්නේද; (නොහොත් තෘෂ්ණානොකරන්නේද); චීවරං, සිවුරක් ලඞාච, ලැබද; අගථිතො, ගථිතනොව (තෘෂ්ණාවශයෙන් නොගෙතුනේ) අමුච්ඡිතො, (මොහයෙන්) මූර්ඡානොව; අනජ්ඣාපන්නො, (තෘෂ්ණාවශයෙන්) නොගැළුනේ; ආදීනවදස්සාවී, (තෘෂ්ණාවසයෙන් ගඪිතපරිභොගයෙහි) ආදීනව දැකීමෙන් යුක්තව; නිස්සරණපඤ්ඤො, (යම් මේ සීතල නැසීම් ආදී) නිස්සරණයම දනිමින්; පරිභුඤ්ජති, පරිභොගකරන්නේද;

---

* සතුටුවන්නාහුගේ—පොත්.

ශායම්පක ඉතරීතර චීවරසන්තුට්ඨියා, ඒ ඉතරීතර චීවර සන්තොසයෙන් වනාහි; නෙවත්තානුක්කංසෙති, (මම පාංශුකූලිකවන්නෙමිය (මා විසින් උපසම්පදමාලකයෙහිදී පාංශුකූලිකාඞ්ගය සමාදන්වනලද්දේය. කවරෙක් මාහා සදෘශවන්නේදැයි කියා) තමා උසස් නොකරන්නේද; නො පරං වම්භෙති, (මේ සෙසු භික්ෂූහු පාංශුකූලික නොවන්නාහුය. පාංශුකූලික මාත්‍රයක්ද මොවුන්ට නැත්තේයයි කියා) අන්‍යයාහට ගර්හා නොකරන්නේද; යොහි, යමෙක් වනාහි; තත්‍ර, ඒ චීවර සන්තෝසයෙහි; (වර්ණවාදී බැව් ආදියෙහි); අනලසො, අලසනොව; දක්ඛො, දක්ෂවන්නේද; සම්පජානො පතිස්සතො, සම්පජඤ්ඤසංඛ්‍යාත ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තවේද; භික්ඛවෙ !, මහණෙනි !; අයං භික්ඛු, මේ මහණතෙම; පොරාණෙ, (අභිනවොත්පත්තිනුවූහෙයින්) පුරාතනයෙහිවූ; අග්ගඤ්ඤෙ, අග්‍රයයි කියා දතයුතුවූ; අරියවංසෙ, (බුද්ධප්‍රත්‍යෙකබුද්ධ අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවකාදිවූ) ආර්‍ය්‍යයන්ගේ වංශයෙහි; ඨිතොති, සිටියෙයයි; වුච්චති, කියනු ලැබේයයි වදාළසේක.

2. භික්ඛවෙ !, මහණෙනි !; පුනච, නැවතද; අපරං, අනික් කාරණයක් (කියමි); භික්ඛු, මහණතෙම; ඉතරීතරෙන පිණ්ඩපාතෙන, (සංඝභත්, උද්දේසභත්; ආදිවූ පසළොස් ප්‍රභෙද පිණ්ඩපාතයන් අතුරෙන් ලබනලද ඔදන කුම්මාසාදී) යම් කිසි පිණ්ඩපාතයකින්; සන්තුට්ඨොහොති, (පසළොස් ප්‍රකාර සන්තෝෂයෙන්) සන්තුෂ්ටවන්නේවේද; (මෙහිදූ පසළොස් ප්‍රකාර සන්තෝෂය නම් පිණ්ඩපාතයෙහි විතර්ක සන්තෝෂය, ගමන සන්තෝසය, පයෙසන සන්තෝසය, පටිලාභ සන්තෝසය, පටිග්ගහණ සන්තෝසය, මත්තාපටිග්ගහණ සන්තෝසය, ලොළුප්පවිවජ්ජන සන්තෝසය, යථාලාභ සන්තෝසය, යථාබල සන්තෝසය, යථාසාරුප්ප සන්තෝසය, උපකාර සන්තෝසය, පරිමාණ සන්තෝෂය, පරිභොග සන්තෝෂය, සන්නිධි පරිවජ්ජන සන්තෝසය, විස්සජ්ජන සන්තෝසය යන මොහුයි.

එහිගණියා හා සමග හැසිරෙන්නාවූ පිණ්ඩපාතිකයා විසින් සවසථෙ රූප ස්ථාන කාලයෙහි හෙට ද්වස කවර තැනෙක්හි පිඩුපිණිස හැසිරෙන්නේදැයි විචාලකල ස්වාමීන්වහන්ස අසවල් ග්‍රාමයෙහියයි මෙපමණක් සිතා එතැන්පටන් නොසිතියයුතුය. ඒකචාරිකයා විසින් විතර්ක මාලකයෙහි සිට විතර්කනය කටයුත්තේය, එතැන්පටන් විතර්කනයකරන්නේ ආර්‍ය්‍යවංශයෙන් චුතවූවානම් වේ, (පිටත්වන්නේ නම් වේ,) මේ විතර්ක සන්තෝෂය නම් වේ, පිඩු පිණිස හැසිරෙන්නහු විසින් වනාහි කොතැන්හිදී ලැබේදයයි නොසිතා කර්මස්ථාන ශීර්ෂයෙන් යායුතුය. මේ ගමන සන්තෝෂය නම් වේ, පිඩු සොයන්නහු විසින් යම් කිසි භික්ෂුකෙණෙක් හා සමග නොගොස් ලජ්ජිප්‍රිය ශීලී භික්ෂූන්වහන්සේ නමක්ම ගෙණගොස් සෙවීම පයෙසන සන්තෝසය නම් වේ, ගෙණඑන්නාවූ පිණ්ඩපාතය දුරින්ම දැක මෙස

මනොඥය මෙය අමනොඥයයි සිතනොසිපදවියයුතුය. මේ පටිලාභ සන්තෝසය නම් වේ, මේදේ මනාපය ඒදෙය ගණිමි, මේදෙය අමනාපය එය නොගනිමියි නොසිතා යම් කිසිවක් යැපෙනපමණ ගැණීම පටිග්ගහණ සන්තෝසය නම් වේ, මෙහි පිණ්ඩපාතය බොහෝය දායකතෙමේ ස්වල්පයක් දෙනු කැමැත්තේය ස්වල්පයක් ගතයුත්තේය. පිණ්ඩපාතය බොහෝය දායකතෙමේද බොහෝ දෙනු කැමැත්තේය ප්‍රමාණයෙන් ගතයුතුය. පිණ්ඩපාතය ස්වල්පය දායකතෙමේද ස්වල්පයක් දෙනු කැමැත්තේය ස්වල්පයක් ගතයුතුය. පිණ්ඩපාතය ස්වල්පය දායකතෙමේ බොහෝ දෙනු කැමැත්තේය, ප්‍රමාණයෙන් ගතයුතුය. මෙසේ ප්‍රමාණය දැන පිළිගැණීම මත්තපටිග්ගහණ සන්තෝසය නම් වේ, ආඪ්‍යකුලයන්කරා නොගොස් ගෙපිළිවෙළින් යායුතුයි මේ ලොලුප්පවිවජ්ජන සන්තෝසය නම් වේ, සැදෑහැයෙන් පැවිදිවූ මහණතෙම මධුරවූ හෝ අමධුරවූ හෝ ආහාරය ලැබ එයින්ම සතුටුවන්නේය අනිකක් නොපතන්නේය ලැබුනේද නොපිළිගන්නේය. මේ පිණ්ඩපාතයෙහි යථාලාභ සන්තෝෂය නම් වේ. යම් කිසි භික්ෂුවක් තමහට ප්‍රකෘතියෙන් විරුඬවූ හෝ ව්‍යාධියට විරුඬවූ හෝ යම් දෙයක් වැලඳූකල අමුතු ව්‍යාධි හෝ උපදිද්ද, ප්‍රථමයෙන් තිබුනු ව්‍යාධිය හෝ වඩිද, මෙසේ යමකින් අපහසුවේ නම් ඒ .භික්ෂුතෙමේ එබඳු ආහරය ලැබුනු කල සභාගභික්ෂූන්ටදී ඔවුන් අතින් අවිරුඬ භෝජනයක් ගෙණ වැලඳීම යථාබල සන්තෝෂයනම්වේ, යම් භික්ෂුකෙණෙක්ප්‍රණීතවූ බොහෝ ආහාර ලැබ චිරප්‍රව්‍රජිත බහුශ්‍රැත අල්පලාභී ගිලන් භික්ෂූන්ට දන්දී එයින් ශෙෂයකින් හෝ පිඩු පිණිස හැසිර මිශ්‍රකාහාරය හෝ වළඳන්නේද මේ යථාසාරුප්ප සන්තෝසය නම් වේ-මේ පිණ්ඩපාතය අනුභවකොට ශ්‍රමණ ධර්මය පුරමියි උපකාරය සලකා පරිභෝගකිරීම උපකාර සන්තෝෂය නම් වේ, පාත්‍රය පුරවා ගෙණෙනලද්දේ නොපිළිගෙණ අනුපසම්පන්නයෙකුලවා ග්‍රහණයකරවා පිළිගැණීමට සුදුසුදෙය පමණක් පිළිගැණීම පරිමාණ සන්තෝෂය නම් වේ, ක්ෂුධා විනොදනය පිණිස පරිභොගකිරීම පරිභෝග සන්තෝසය නම් වේ, නග නගා තබා පරිභොග නොකිරීම සන්නිධි පරිවජ්ජන සන්තෝෂය නම් වේ, මුනුණ නොබලා සාරාණීය ධර්මයෙහි සිට විසර්ජනයකිරීම විස්සජ්ජන සන්තෝසය නම් වේ.

පිණ්ඩපාත ප්‍රතිසංයුක්ත ධුතාඞ්ග නම්—පිණ්ඩපාතිකාඞ්ගය, සපදාන චාරිකාඞ්ගය, ඒකාසනිකාඞ්ගය, පත්තපිණ්ඩිකාඞ්ගය, ඛලුපච්ඡාභත්තිකාඞ්ගය යන පසයි, (මෙහි විස්තර විශුඞිමාර්ගයෙන් දතයුත්තේය,) මෙසේ පිණ්ඩපාත සන්තෝස මහා ආර්ය්‍යවංශය පුරණු ලබන්නාවූ මහණතෙම මේ පඤ්ච ධුතාඞ්ගයන් ගෝපනයකරන්නේය. මේ ධුතාඞ්ගයන් ගෝපණය කරන්නේ පිණ්ඩපාත සන්තෝෂ මහා ආර්ය්‍යවංශයෙන් පසළොස් ප්‍රකාර සන්තෝෂයෙන් සතුටුවන්නේ වේ. ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨියාව,

(මධුර අමධුරාදී යම් කිසි) ලත් ස්වභාවවූ පිණ්ඩපාතයකින් සතුටුවී මෙහිද; වණ්ණවාදී, ගුණ කියන සුළුවේද; පිණ්ඩපාතහෙතු, පිඩු පිණිස; අප්පතිරූපං, නුසුදුසුවූ; අනෙසනං, (දූත මෙහෙවර දී නානාප්‍රකාර) අනේෂණයට; නච ආපජ්ජති, නොපැමිණෙන්නේද, පිණ්ඩපාතං, පිණ්ඩපාතයක්; අලද්ධාච, නොලැබද; න පරිතස්සති, (කෙසේ වනාහි ආහාර ලැබෙන්නේදෝයි පුණ්‍යවන්ත භික්ෂූන් හා එකතුව කුහක ක්‍රියාවෙන්) ත්‍රාසනොවන්නේද; (නොහොත්) තෘෂ්ණා නොකරන්නේද, පිණ්ඩපාතං, පිණ්ඩපාතයක්; ලද්ධාච, ලැබද; අගධිතො, ගධිතනොව (තෘෂ්ණාවශයෙන් නොගැතුනේ) අමුච්ඡිතො, මෝහයෙන් මූර්ඡානොව; අනජ්ඣාපන්නො, (තෘෂ්ණාවශයෙන්) නොහැළුනේ; ආදීනවදස්සාවී, (තෘෂ්ණාවශයෙන් පරිභොගයෙහි) ආදීනව දකිමෙන් යුක්තව; නිස්සරණපඤ්ඤො, ක්ෂුධාදිය පිණිස නොවලදම් යනාදී) නිස්සරණය දනිමින්; පරිභුඤ්ජති, පරිභෝගකරන්නේද; තායච පන ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨියා, ඒ යම් කිසි පිණ්ඩපාත සන්තෝෂයකින් වනාහි; නෙවත්තානුක්කංසෙති, (මම පිණ්ඩපාතිකයෙමි, මා විසින් උපසම්පදමාලකයේ පටන් පිණ්ඩපාතිකාඞ්ගය සමාදන්වනලද්දේය, කවරෙක් මා හා සදෘශවන්නේදැයි කියා) තමා උසස් නොකරන්නේද; නොපරං වම්භෙති, (මේ සෙසු භික්ෂූහු පිණ්ඩපාතික නොවන්නාහ, පිණ්ඩපාත මාත්‍රයක්ද මොවුන්ට නැතැයි කියා) අන්‍යයාහට ගර්හා නොකරන්නේද; යො හි, යමෙක් වනාහි; තත්ථ, ඒ පිණ්ඩපාත සන්තෝෂයෙහි (වණ්ණවාදී බැව් ආදියෙහි); අනලසො, අලසනොව; දක්ඛො, දක්ෂවන්නේද; සම්පජානො පතිස්සතො, සම්පජඤ්ඤ ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තවේද; භික්ඛවෙ, මහණෙනි; අයං භික්ඛු, මේ මහණතෙම; පොරාණෙ, (අභිනවොත්පන්නයි නුවූහෙයින්) පුරාතනයෙහිවූ; අග්ගඤ්ඤෙ, අග්‍රයයි කියා දතයුතුවූ, අරියවංසෙ, (බුද්ධප්‍රත්‍යෙකබුද්ධශ්‍රාවකාදී) ආර්යයන්ගේ වංශයෙහි; ඨිතොති, සිටියේයයි; වුච්චති, කියනුලැබෙයි වදාළසේක.

3. භික්ඛවෙ, මහණෙනි; පුනච, නැවතද; අපරං, අනික් කාරණයක් (කියමි); භික්ඛු, මහණතෙමේ; ඉතරීතරෙන සෙනාසනෙන, (සංඝගණ ආදිවූ ෂඩ්විධ ක්ෂෙත්‍රයන් අතුරෙන් ලබනලද ඇඳපුටු ආදිවූ සෙනසුන් අතුරෙන්) යම් කිසි සෙනාසනයකින් (හෙවත් යම් කිසි සෙනාසනයක්කරණකොටගෙණ; සන්තුට්ඨො හොති, (පිණ්ඩපාතයෙහි දක්වනලද ක්‍රමයෙන්ම විතක්ක සන්තොසාදී පසළොස් ප්‍රකාර සන්තෝෂයෙන්) සතුටුවන්නේද; ඉතරීතර සෙනාසන සන්තුට්ඨියාච. (රුසුවූ; ප්‍රණීතවූද ලබනලද) යම් කිසි සෙනසුනකින් සතුටුවීමෙහි; වණ්ණවාදී, ගුණ කියන්නේද; සෙනාසනහෙතු, සෙනසුන් පිණිස; අප්පතිරූපං, නුසුදුසුවූ; අනෙසනං, අනේෂණයට; නච ආපජ්ජති, නොපැමිණේද; සෙනාසනං, සෙනසුනක්; අලද්ධාච, නොලැබද; න පරිතස්සති, (කෙසේ වනාහි සෙනසුනක් ලබම්දෝහෝයි කියා) උවමනාට (නොහොත්) තෘෂ්ණාවට නොපැමිණේද; සෙනා

සතං, සෙනස්නක්; ලද්ධාව, ලැබද; අගධිතො, ගිජ්ඣනොව; අමුච්ඡිතො, මූර්ජානොව; අනජ්ඣොපන්නො, ගෑලීමක්නොව; ආදීනවදස්සාවී, පරිභොගයෙහි ආදීනව දකිමින් යුක්තව; නිස්සරණපඤ්ඤො, (යම් සේ සීතල නැසීම් ආදී නිස්සරණය දකිමින්; පරිභුඤ්ජති, පරිභොගකරන්නේද; තායච පන ඉතරීතර සෙනාසන සන්තුට්ඨියා, ඒ යම් කිසි සෙනාසන සන්තොෂයකින්; නෙවත්තානුක්කංසෙති, අත්තුක්කංසන නොකරන්නේද; නොපරං වම්භෙති, (මේ සෙසු භික්ෂූන් යම් කිසි සේනාසනයකින් සතුටු නොවන්නාහයි කියා) අනුන්ට නින්දා නොකරන්නේද, යොහි, යමෙක් වනාහි; තත්‍ර, ඒ සෙනාසන සන්තොෂයෙහි (වර්ණවාදීබැවු ආදියෙහි); අනලසො, අලසනොව; දක්ඛො, දක්ෂවන්නේද; සම්පජානො පතිස්සතො, සම්පජඤ්ඤ සංඛ්‍යාත ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තවේද; භික්ඛවෙ!, මහණෙනි!; අයං භික්ඛු, මේ මහණතෙම; පොරාණෙ, පුරාතනයෙහිවූ; අග්ගඤ්ඤෙ, අග්‍රයයි කියා දැනගතයුතුවූ; අරියවංසෙ, බුද්ධාදී ආර්යයන්ගේ වංශයෙහි; ඨිතො, සිටියේයයි; වුච්චති, කියනුලැබෙයි වැළිසේක —

4. භික්ඛවෙ!, මහණෙනි; පුන ච, නැවතද; අපරං, අනිකුදු (ආර්යවංශයක් කියමි;) භික්ඛු, මහණතෙම; භාවනාරාමො, (සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඉර්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොධ්‍යඞ්ග, සප්ත අනුපස්සනා, අටළොස් මහා විදර්ශනා, සත්තිස් බොධිපාක්ෂික ධර්ම, අටතිස් අරමුණු ආදී) භාවනාවෙහි ඇලෙනලද්දුව; භාවනාරතො හොති, භාවනාරාමයෙන් යුක්තවේද; පහානාරාමො, (කාමච්ඡන්දාදී ක්ලේශයන් පහකිරීමෙහි) ඇලෙනලද්දුව; පහානාරාමො හොති, පහානාරාමයෙන් යුක්තවේද; (හෙවත් කාමච්ඡන්දාදී ක්ලෙශයන් පහකිරීමෙහි ඇලෙන්නේවේද;) තායචපන භාවනාරාමතාය භාවනාරතියා, ඒ භාවනාරාමතාවෙන්ද භාවනාරතියෙන්ද; පහානාරාමතාය පහානරතියා, ඒ පහානාරාමතාවෙන් හා පහානරතියෙන් වනාහි; නෙවත්තානුක්කංසෙති, (අනිත්‍යය දුඃඛය අනාත්මයයි කියා විදර්ශනා පිණිස භාවනාකරන්නාවූ මට අදට සැටඅවුරුද්දෙක් වන්නේය. කවරෙක් මාහා සදෘශවන්නේදැයි කියා) තමා උසස් නොකරන්නේද; නොපරං වම්භෙති, (අනිත්‍යය දුඃඛය අනාත්මය යන විදර්ශනා මාත්‍රයකුදු නැත්තේය හරිණලද කර්මස්ථානයෙන් යුක්තවූ මොවුන්ගෙන් ප්‍රයොජන කවරේද කියා' අනුන්ට නින්දා නොකරන්නේද; යොහි, යමෙක්තෙම වනාහි; තත්‍ර, ඒ භාවනාරාම පහානාරාමයෙහි ගුණ කීම් ආදියෙහි; අනලසො, අලස නොව; දක්ඛො, දක්ෂවන්නේද; සම්පජානො පතිස්සතො, සම්පජඤ්ඤසංඛ්‍යාත ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තවේද; භික්ඛවෙ!, මහණෙනි!; අයං භික්ඛු, මේ මහණතෙම; පොරාණෙ, පුරාතනවූ; අග්ගඤ්ඤෙ, අග්‍රයයි දැනගතයුතුවූ; අරියවංසෙ, බුද්ධාදී ආර්යයන්ගේ වංශයෙහි; ඨිතොති, සිටියේයයි; වුච්චති, කියනුලැබේ —

භික්ඛවෙ!, මහණෙනි; ඉමෙ චත්තාරො අරියවංසා, මේ සතර ආර්යවංශයෝ; (ආර්ය ප්‍රවේණි ධර්මයෝ ආර්යමාර්ගයෝ වනාහි), අග්ගඤ්ඤා, අග්‍රයයි

කියා දැනගතයුත්තාහ; රත්තඤ්ඤූ, දීර්ඝකාලයක පටන් පවතින්නාහයි දැනගතයුත්තාහ; වංසඤ්ඤූ, බුද්ධාදී ආර්‍ය්‍යයන්වහන්සේලාගේ වංශයයි දතයුත්තාහ; පොරාණා, (අභිනවොත්පත්තිනොවූහෙයින්) පුරාතනහ; අසංකිණ්ණා, පහනොකරණලදහ; අසංකිණ්ණපුබ්බා, 'මෙයින් ප්‍රයෝජන කවරේදැයි කියා අතීතකාලයෙහි බුද්ධාදී උත්තමයන් විසින්) පහනොකළ විරූහ; න සංකීයන්ති, (දැනුදු මෙයින් ප්‍රයෝජනකවරේදැයි කියා) පහ නොකෙරෙත්; න සංකීයිස්සන්ති, (මතු අනාගතයෙහි ඇතිවන්නාවූ බුද්ධාදී උත්තමයන්වහන්සේලා විසින්ද මෙයින් ප්‍රයෝජන කවරේදැයි කියා) පහ නොකරණු ලැබෙත්; විඤ්ඤූහි, නුවනැත්තාවූ; සමණේහි, (සංසිඳුවනලද කෙලෙසුන් ඇති) ශ්‍රමණයන් විසින්ද; බ්‍රාහ්මණේහි, (පහකරණලද කෙලෙසුන් ඇති) බ්‍රාහ්මණයන් විසින්ද; අප්පටිකුට්ඨා, නින්දාගර්හා නොකරණ ලදහ (යි;) සූත්‍රාන්තය විනිවර්තනයකොට දැන් වනාහි මහා ආර්‍ය්‍යවංශය පුරන්නාවූ භික්ෂූහුගේ වසන දිශාවත් දක්වනසේක් "ඉමෙහි ච පන භික්ඛවෙ" යනුවෙන් වදාළසේක––

භික්ඛවෙ!, මහණෙනි; ඉමෙහිච පන චතූහි අරියවංසෙහි සමන්නාගතො භික්ඛු, මේ සතර ආර්‍ය්‍යවංශයෙන් වනාහි සමන්විත මහණතෙම; පුරත්ථිමායචෙපි දිසාය, ඉදින් පූර්වදිශාවෙහි වනාහි; විහරති, වාසයකරයිද; සො එව, හෙතෙමේම; අරතිං, (අනභිරතිසංඛ්‍යාත උකටලීභාවය; සහති, අභිභවනයකරයි; (ඉවසයි.) නතං අරති සහති, (අධිකුසල ධර්මයන්ගේ වැඩීම පිණිස ප්‍රාන්ත ශයනාසනයෙහි යම් ඒ නොඇලීමක් නම් වේද ඒ නොඇලීම ඒ මහණහු අභිභවනය නොකරයි.

පච්ඡිමාය චෙ'පි දිසාය විහරති, ඉදින් පශ්චිමදිශාවෙහි වාසයකෙරේද; සො එව හෙතෙමේම; අරතිං, උකටලීභාවය; සහති, මැඩපවත්වයි; අරති, උකටලිය; තං, ඕහු; නසහති, මැඩනොපවත්වයි.

උත්තරායචෙ'පිදිසාය විහරති, ඉදින් උත්තරදිශාවෙහි වාසයකෙරේද; සො එව, හෙතෙමේම; අරතිං, උකටලීභාවය; සහති, මැඩපවත්වයි; අරති, උකටලිය; තං, ඕහු; නසහති, මැඩනොපවත්වයි.

දක්ඛිණායචෙ'පිදිසාය විහරති, ඉදින් දක්ෂිණදිශාවෙහි වාසයකෙරේද; සො එව, හෙතෙමේම; අරතිං, උකටලීභාවය; සහති, මැඩපවත්වයි; අරති, උකටලිය; තං, ඕහු; නසහති, මැඩනොපවත්වයි;–තංකිස්සහෙතු, ඊට හේතු කවරේදයත්? භික්ඛවේ, මහණෙනි; ධීරො, පණ්ඩිතතෙම; අරතිරතිසහො, උකටලීභාවයද කාමයද මැඩපවත්වන්නේය; හි, එහෙයිනි––

නාරති සහතීධීරං–නාරතිධීර සංහති
ධීරොව අරතිං සහති–ධීරොහි අරතිං සහො.

සබ්බකම්මවිහායි * නං-පණුන්නංකො නිවාරයෙ,
නෙක්ඛං ජම්බොනදස්සෙව-කොතංනින්දිතු'මරහති,
දෙවාපිනං පසංසන්ති-බ්‍රහ්මුනාපි පසංසිතො'ති.

අරති, උකටලිය; ධීරං, පණ්ඩිතයා; නසහති, මැඩනොපවත්වයි; (ඒ කුමක් හෙයින්ද?)—අරති, උකටලිය; නධීරසංහති, පණ්ඩිතයා මැඩපවත්වන්නී නොවෙයි; ධීරොච, පණ්ඩිතතෙමේම; අරතිං, උකටලීභාවය; සහති, මැඩපවත්වයි; ධීරො, පණ්ඩිතතෙම; අරතිංසහො, උකටලීභාවය මැඩපවත්වන්නේය; ති, එහෙයිනි.

සබ්බකම්මවිහායීනං, සර්වකර්මපරිච්ඡෙදකළාවූ; පණුන්නං, ක්ලේශයන් දුරුකොට සිටියාවූ පුද්ගලයා; කො, කවරනම් රාගාදි පාපධර්මකෙණෙක්; නිවාරයෙ, වලක්වන්නේද; ජම්බොනදස්ස, ජාම්බොනදසවර්ණයා සමබන්ධිවූ; නෙක්ඛංඉව, නිෂ්කයක්වැනිවූ; තං, ඒ පුද්ගලයාට; නින්දිතුං, ගර්හා කරන්ට; කො අරහති, කවරෙක් සුදුසුවේද? (නොවන්නේමැයි)-දෙවාපි, දෙවියෝද; නං, ඔහුට; පසංසන්ති, ප්‍රශංසාකරත්; බ්‍රහ්මුනාපි, (මහා) බ්‍රහ්මයා විසින්ද; පසංසිතො, ප්‍රශංසාකරණ්ලද්දේයයි සනරාමරලොකදිවාකරවූ භාග්‍යවත් අතීත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන්වහන්සේ මේ මහා ආර්‍ය්‍යවංශ සූත්‍රදෙශනාව නිමවා වදාළසේක.

---

* විහායිනං-පාඨවී,

# දැන් වීමයි.

මේ සූත්‍රය වනාහී අඞ්ගුත්තර චතුෂ්ක නිපාතයට අයත් සූත්‍රයකි මේ භික්ෂූන් විසින් නිතර භාවිතා කටයුතුවෙයි.

එබැවින් මෙය ගාල්ලේ ශ්‍රී සුදර්ශනාරාම පරිවෙණාධිපතිව වැඩවිසූ ආචාර්ය පඤ්ඤාලංකාර ශ්‍රී සුමන තිස්ස ස්වාමීන් වහන්සේ තමශිෂ්‍යයන් වහන්සේලාට ප්‍රගුණ කරවා දිනපතා පිළිවෙලට ධර්මදේශනා කරවන කල මින්වාගේ අභාව ගියසකාමි මෙය ගොඩින්ක සාමින්ගේ සහායෙන් මාලවා මුද්‍රණය කර වීම පිණිස සන්නදෙකක් සපයාගෙණ බැලූ පමණින් කොපි කර කත් තෝරුවට බාරදෙවා ඉපාමීයක වැඩ සම්පූර්ණයෙන් නිම කරවා තුබුණේය- එය දෙෂයන්ගෙන් විනිර්මුක්තබැව් නොකියමු. මාගම් පුරයෙහි රාජදහයිය රජමහ විහාර සංඛ්‍යාත යටාල මැණික් විහාරාධිපති, "තංගල්ලේ ජිනරතන තිස්ස" මහාස්ථවිර ස්වාමීන්වහන්සේගේහා තමන්සෑවූ මිරිස්සේ අභිනවාරාමාධිවාසී "තංගල්ලේ සුනන්දසභ" ස්ථවිරයාමීන්වහන්සේගේද ශිෂ්‍යවූ "මිරිස්සේ **ඤාණරතන තිස්ස** ස්වාමීන්වහන්සේ ලවා ඉතුරුහරිය ශුද්ධ කරවාගෙණ නැවත මුලපටන් මුද්‍රණය කරවූයෙමි.


මෙහි යම් ප්‍රමාදදෝෂයක් ඇතහොත් සුධීන් විසින් ශුද්ධකරණුලැබේවා.

මෙවගට,

ඩී. ඕ. ඩී. ඇස්. ජයසූරිය
කොන්දෙස්තර

1898 මාර්තු මස 1 දින
මිරිස්සේදිය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු